# ගොවි කටයුතු සමීක්ෂණ හා ජනතාව

ගොවි කටයුතු විමර්ශක ලලිත් ජයසූරිය විසිනි.

**වඩා හොඳ පරිසරයක්, වඩා හොඳ ජීවන තත්ත්වයක්, වඩා හොඳ නව ලෝකයක් ගොඩ නැංවීම සඳහා අවශ්‍ය තොරතුරු සපයා ගැනීම සමීක්ෂණවල එක් පරමාර්ථයකි.**

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල ගොවි කටයුතු හා අදාළ කරුණු පිළිබඳ සමීක්ෂණ පැවැත්වීම ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ වගකීම් වලින් ඉතා වැදගත් ස්ථානයක් ගනී. මෙම ලිපියෙන් අදහස් කරන්නේ එවැනි සමීක්ෂණ සඳහා තොරතුරු ලබාගැනීම හා සම්බන්ධ කරුණු සමහරක් ගැන සාකච්ඡා කිරීමට ය.

අපි මොහොතකට සිතමු, වැඩි අස්වනු ගෙන දෙන වී වර්ගයක් සොයාගත්තාය කියා. ඒක පර්යේෂකයාගේ පෞද්ගලික ජයග්‍රහණයක් පමණක්ද? නැත. මුලු කෘෂිකර්මයේම ජයග්‍රහණයකි. එහි ප්‍රතිඵල මුලු මහත් ගොවි ජනතාවටම විඳින්න පුලුවනි. එපමණක් ද නොවෙයි ඒ වී වර්ගය හේතුවෙන් නිෂ්පාදනය වැඩි වුවහොත් ඒක අපේ මවුබිමේ මුලු මහත් ජනතාවගේ ම ජයක්. මුලු ලෝකයේම ජයක්.

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගින් ප්‍රධාන වශයෙන් සිදු කරන්නේ ගොවිකටයුතු හා සම්බන්ධ ආර්ථික විද්‍යාත්මක සහ සමාජ විද්‍යාත්මක පර්යේෂණ යි. ස්වභාවික විද්‍යාත්මක පර්යේක්ෂණයක් සමහර විටක දී, විද්‍යාගාරයක් තුළම පැවැත්වීමට හැකිවුවත් සමාජ –ආර්ථික විද්‍යාත්මක පර්යේෂණයක 'විද්‍යාගාරය' වන්නේ, ඉලක්ක කරගෙන සිටින ජන කොට්ඨාශය ජීවත්වන මුලු ප්‍රදේශමයි. මෙවැනි පර්යේෂණ සඳහා තොරතුරු ලබාගැනීමට 'සමීක්ෂණ' පවත්වනවා. ඒවායින් ලබාගත හැකි ප්‍රතිඵල දහස් සංඛ්‍යාත, ලක්ෂසංඛ්‍යාත ජනතාවකට ප්‍රයෝජනවත් වන අයුරින් සමාජ ආර්ථික ක්ෂෙත්‍රයන් පිළිබඳ මෙතෙක් රැස්කර ගෙන ඇති දැනුම් සම්භාරයට එකතු වෙනවා. සමාජ ආර්ථික සමීක්ෂණයකට, කොටස් කිහිපයක සහභාගිත්වය අවශ්‍ය වෙන අතර මෙවැනි සමීක්ෂණයක දී වැදගත්ම සේවයක් ඉටු කරන කොටසක් තමයි සමීක්ෂණයට සහභාගි වෙමින් තොරතුරු සපයන උත්තර කරුවන්.

### සමීක්ෂණ කෙරෙන්නේ මෙහෙමයි.

උදාහරණයක් විදියට අපි පවුල් 500 ක් සිටින ගමක තෝරාගත් නිවාස 100 ක සැම්පලයකින් 20 ක් පොල්අතු සෙවිලි කළ නිවාස යයි සිතමු අපේ සැම්පලය තේරීමේ දී මුලු ගමේම සෑම කොටසක්ම නියෝජනය වන ලෙස නිවාස තෝරා ගෙන තිබුණි නම්, නිවාස 500 ම ගැන සලකා බලන විට දී ඉන් 20% ක් හෝ 100 කට ආසන්න සංඛ්‍යාවක් පොල් අතු සෙවිලි කළ නිවාස විය යුතුයි.

### සංවර්ධනයට අතදීමක්

බොහෝ විට නැගෙන තවත් ප්‍රශ්නයක් තමයි, සමීක්ෂණය සඳහා සහභාගි වීමෙන් උත්තරකරුවන්ට ලැබෙන පෞද්ගලික වාසි මොනවා ද ? කියන එක. මෙතන දී අපි ආයෙත් මතක් කරන්න ඕනෑ සමීක්ෂණයකදී කෙරෙන්නෙ පොදු තොරතුරු රැස් කිරීමක් යන්න. එයින් ප්‍රයෝජන අත්වෙන්නෙ අදාළ මුළු ප්‍රදේශයටමයි. ජාතික මට්ටමේ එකක් නම් මුලු රටටමයි. සමාජ ආර්ථික තත්වය, නැතිනම් යම් ප්‍රශ්නයක් ගැන ඊට අදාළ තොරතුරු හෝ ජනතාවගේ ආකල්ප හෝ දැන

(35 පිටුවට)

(29 පිටුවෙන්)

හැදිනගෙන ඒවා විග්‍රහකිරීමෙන් විද්‍යාත්මකව විශ්ලේෂණය කිරීමෙන්, රටේ ප්‍රශ්න විසඳීමට, සංවර්ධන යෝජනා ක්‍රම සැලසුම් කිරීමට, වැදගත් මෙහෙයක් සමීක්‍ෂණ වලින් ඉටුවෙනවා. සමහර විට උත්තර කරුවෙකුට පෞද්ගලිකව සහ කෙලින්ම වාසියක් නොවුවත් සමීක්‍ෂණ වලින් හෙලිදරව් වන කරුණු වලින් පොදුවේ මහජනතාවට ප්‍රයෝජනවත් වන පියවර ගැනීම සඳහා අදළ අංශවලට මග පෙන්වීමක් සිදුවෙනවා.

සමීක්‍ෂණයකට සහාය දෙමින් ඊට හවුල් වෙන්න ඔබට පුලුවන් කොහොමද? මෙතැනදී ඔබ යම්කිසි සමීක්‍ෂණයක් සඳහා තෝරාගත් ගොවි මහතෙක් හෝ වෙනත් උත්තර කරුවෙක් නම්, ඔබ හමුවට සමීක්‍ෂණ නිලධාරීන් ආ විට ඒ අය සමඟ කතා කරන්නට, සාකච්ඡා කරන්නට ඔබේ වටිනා කාලයෙන් මොහොතක් වැය කරන එක ලොකු සහයෝගයක්. අපට අත්දැකීමෙන් කියන්න පුළුවන් සමහර සමීක්‍ෂණ වලදී හමුවෙලා තියෙනවා ජීවිතයේ කවදවත් තමන්ගෙ ප්‍රශ්න, දුක්ගැනවිලි, ගැටළු සහ අදහස් –උදහස් වලට ඇහුම්කම් දෙන්න නිලධාරියෙක් ඇවිත් නැති ගෙවල්. විමර්ශකවරුන් සූදනම් ආඥාවකින් යුතුව ඔබට කන්දෙන්න. අපි පැමිණෙන්නෙ, විවෘත මනසකින් යුතුවයි. යම් ප්‍රශ්නයක් ගැන අපේ පෞද්ගලික මතය අතහැර දමලයි ඔබ හමුවට එන්නෙ. ඔබේ මතයට මැදහත්ව කන්දෙන්නයි, ඔබේ තොරතුරු දැනගන්නයි, කොටින් කියතොත්, ජනතාවගෙන් ඉගෙනගන්නයි පර්යේෂකයෙක්, විමර්ශකයෙක් ජනතාව හමුවට එන්නෙ. මේ නිසා හොඳ මිත්‍රත්වයකින් හොඳ පරමාර්ථයකින් ඔබේ අදහස්–උදහස් තොරතුරු අපට කියන්න.

ඔබ විසින් සපයනු ලබන සෑම තොරතුරක්ම නිශ්චිත විය යුතුයි. සත්‍ය විය යුතුයි. සමීක්ෂණයකදී ලැබෙන තොරතුරු මිල කළ නොහැකියි. සමහර සමීක්ෂණවලදී, ලැබෙන තොරතුරු ඉතාම නිවැරදි ලෙස විග්‍රහ කරන්න, විශ්ලේෂණය කරන්න රුපියල් දහස් ගණනක් වැය කරලා පරිගණක යන්ත්‍රවල–කොම්පියුටර්වල–සහාය ලබාගන්නවා. ඒත් ගොවි මහත්වරුන් නිවැරදි තොරතුරු සපයා නැත්නම් ප්‍රදේශයේ තත්ත්වය තක්සේරු කිරීමේ දී වැරදි නිගමන ප්‍රතිඵල වන්ට පුළුවනි. ඒ ප්‍රතිඵල පදනම් කරගෙන සැලසුම් කරන සංවර්ධන යෝජනා ක්‍රමවලදී පාඩු සිදුවෙන්නෙ ජනතා වටමයි. මේ අනුව, පැහැදිලිව ඔප්පු වෙනවා සමීක්‍ෂණයකට සහභාගි වෙන උත්තරකරුවන්ගෙන් ඉතාම වැදගත් කාර්ය භාරයක් ඉටුවන බව. ඒ කාර්යය සඳහා ඔබේ සහාය අපි අගේ කරනවා.

## තොරතුරු හෙළි කරන්නේ නෑ

විශෙෂයෙන්ම සඳහන් කළයුතු තවත් කාරණයක් තමයි, සමීක්‍ෂණයකදී ලබාගන්නා සෑම පෞද්ගලික තොරතුරක්ම ඉතාම රහසිගතව තබා ගන්නා බව. අවශ්‍ය දත්ත ලබාගැනීම හැර වෙනත් කිසිම කාර්යයක් සඳහා තොරතුරු යොද වන්නේ නෑ. වෙනකක් තබා ඔබේ නම අපි ප්‍රයෝජනයට ගන්නෙ සැම්පලයට හෙවත් නියැදීයට අයත් නිවාස කිසිවක් අත නො හැර සමීක්‍ෂණය කර තිබේ ද කියලා දැගගන්න පමණයි. ඉන් පසුව හැම අවස්ථාවකදී ඔබව හඳුන්වන්නෙ අංකය කින්. මේ නිසා අවශ්‍ය තොරතුරු විග්‍රහ කිරීමෙන් පසුව සමීක්‍ෂණය කරන නිලධාරීන්ටවත් සොයාගන්න අමාරුයි පෞද්ගලිකව මේ තොරතුරු ලැබුනෙ කාගෙන්ද කියන එක. වෙනත් කිසිම ආයතනයකට හෝ දෙපාර්තමේන්තුවකට හෝ ඔබේ පෞද්ගලික තොරතුරු මොනම හේතුවක් නිසාවත් ලබා දෙන්නේ නැහැ.

**අද ගොවියෝ – හෙට දෙවියෝ**
**ඔබත් ගොවි ජනතා දායකයකු වන්න.**

ගොවි සෙතට මංපෙත තනිවද එක්වද
ගල්ගමුවේ අත්හද බැලීම (අවසාන කොටස ලබන කලාපයේ)